# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 11,555 — 1958 ඔක්තෝබර් 17 වැනි සිකුරාදා — 17.10.1958**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)**


# IV වැනි කොටස—පළාත් පාලනය

**(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)**


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... | 897 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ ... | — |
| තනතුරු—ඇබෑර්තු ... ... | — | අය වැය ලේඛන ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — | දේපල විකිණීම ... ... | 901 |
| අතුරු ව්‍යවස්ථා ... ... | 897 | මාගී කොමිටි දැන්වීම් ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපණත යටතේ දැන්වීම් ... ... ... | — | විවිධ දැන්වීම් ... ... | 902 |


## පළාත් පාලන නිවේදන

**1946 යේ අංක 57 දරණ පළාත් පාලනය පිළිබඳ**

**(පාලනමය) ආඥාපනත**

පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්‍ය්‍යාලීය සහකාර කොම සාරිස් සී. සූරියකුමාරන් මහතා, සමකීය රාජකාර්‍ය්‍ය කටයුතුවලට අමතර වශයෙන්, 58. 10. 1 වැනි දින සිට 58. 10. 23 වැනි දින දක්වා නිවාඩු යන සබරගමුව කොට්ඨාශයේ පළාත් පාලන සහකාර කොමසාරිස්වර පී. කේ. දිසානායක මහතා වෙනුවට එම කාලසීමාව තුළ එකී කොට්ඨාශයේ වැඩ බැලීම පිණිස රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කොට තිබේ.

ඊ. ආර්. බයස් අබේසිංහ,
වැඩබලන පළාත් පාලන කොමසාරිස්.

1958 ඔක්තෝබර් 8 දින.

---

**වාරියපොල ගම්කාර්‍ය්‍ය සභාව**

**මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (201 වන පරිච්ඡේදය) 13 ඒ වගන්තිය යටතේ නිකුත් කරන නියෝගයයි**

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (201 වන පරිච්ඡේදයේ) 13 ඒ දරණ වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලයේ ප්‍රකාර නිසි නිලධාරියාවූ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වාරියපොල ගම් කාර්‍ය්‍ය සභාවේ සභාපති දෙස්තර ආර්. ඇන්. ද සිල්වා වන මම, 1960 ජූනි මස 30 වැනිදාසින් අවසන්වන මෙම ගම්කාර්‍ය්‍ය සභා කාල සීමාව තුළ වාරියපොල ගම්කාර්‍ය්‍ය සභාවේ ගම්ප්‍රදේශය ඇතුළත මස් පිණිස සතුන් මැරීම මෙයින් තහනම් කරමි.

දොස්තර ආර්. ඇන්. ද සිල්වා,
සභාපති.

ගම්කාර්‍ය්‍ය සභා කාර්‍ය්‍යාලය,
වාරියපොල,
1958 ඔක්තෝබර මස 6 වැනි දින.

---

## අතුරු ව්‍යවස්ථා

ජී.බී. 14/8/5

**ගම්සභා ආඥාපනත**

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ ගාල්ල දිස්ත්‍රික්කයේ ගාල්ල කඩවත් සතරේ පෝද්දල ගම් ප්‍රදේශයේ පෝද්දල ගම්කාර්‍ය්‍ය සභාව විසින් සම්පාදිතව, 1947 සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිතවූ එකී වගන්තියෙන් පළාත් පාලනය සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාවයි.

වී. සී. ජයසූරිය,
පළාත්පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍ය කාර්‍ය්‍යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1958 සැප්තැම්බර් 30 වැනි දින,
කොළඹදීය.

## අතුරු ව්‍යවස්ථාව

වර්ෂ 1941 පෙබරවාරි මස 28 වැනි දින අංක 8,719 දරණ ගැසට් පත්‍රයේ පළවූ රථවාහන හා සතුන් පිළිබඳ බද්ද සම්බන්ධයෙන්වූ අතුරු ව්‍යවස්ථා, ඊට යාකොට ඇති උප ලේඛනය අස්කොට වෙනුවට පහත සඳහන් අළුත් උප ලේඛනය යෙදීමෙන් මෙසින් සංශෝධනය කරනු ලැබේ :—

### උප ලේඛනය

| | |
|---|---|
| ගොන් දෙන්නා බඳින සෑම කරත්තයක් හෝ තිරික් කලයක් සඳහා ... ... | පෝ.බ.ක. |
| තනිගොනා බඳින සෑම කරත්තයක්, තිරික් කලයක්, අත්කරත්තයක් සඳහා ... ... | පෝ.නි. |
| සෑම බයිසිකලයක් සඳහා ... ... | පෝ.බ. |
| කරත්තයක් අත්කරත්තයක් රික්ෂෝ කරත්තයක් හැර වෙන ඕනෑම අන්දමක රථවාහනයක සඳහා ... | පෝ.ර. |
| සෑම ජින් රික්ෂෝ කරත්තයක් සඳහා ... | පෝ.ජි. |

---

ඇල්. ජී. බී.—ජී.සී. 14/31

## ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ මුරුතැන්ගේ ගම්ප්‍රදේශයේ ගම් කාර්‍ය සභාව විසින් සම්පාදිතව, 1947 ක්වූ සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිත වූ එකී වගන්තියෙන් පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍ය කාර්‍යාංශයේ ස්ථාවර ලේකම් තැන.

ඔක්තෝබර් 30 දින කොළඹ දීය.

### අතුරු ව්‍යවස්ථා

1. පහත දැක්වෙන කර්මාන්ත අප්‍රසන්නවූ කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ :—

(1) ජාඩි හෝ කරවල ගබඩා කිරීම.

(2) නොග ගණනේ විකිණීම පිණිස නරක්විය හැකි ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීම.

(3) කොම්පෝස්ට් නොහොත් කෘත්‍රිම පොහොර සෑදීම.

(4) විනාකිරි සෑදීම.

(5) සබන් සෑදීම.

(6) දුම්කොළ වියලීම, සකස් කිරීම.

(7) පුවක් වියළා සකස් කිරීම.

(8) සතුන්ගේ හම් හෝ ඇට කටු හෝ ගබඩා කිරීම.

(9) රබර් ෂීට් හෝ ක්‍රේප් රබර් දුම් ගැස්සීම හා සෑදීම.

(10) කෘත්‍රිම පොහොර හෝ කෘත්‍රිම පොහොර සෑදීමට ගන්නා ද්‍රව්‍ය ගෝනි තුනකට වඩා ගබඩා කිරීම.

(11) ලැලි පොහවා සකස් කිරීම.

(12) සුරුට්ටු, සිගරැට් හෝ බීඩි සෑදීම.

(13) රා එකතු කරන ස්ථානයක් තබා ගැනීම.

(14) පැණි හෝ හකුරු සෑදීම.

(15) රබර් වියලීම හෝ සෑදීම.

2. පහත සඳහන් කර්මාන්ත අන්තරා දායක කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ :—

(1) වඩු මඩුවක් තබා ගැනීම.

(2) කොප්පරා සෑදීම.

(3) තෙල් වලින් හෝ වාෂ්ප බලයෙන් හෝ පැට්රල් ආදී දැවෙන ද්‍රව්‍ය වලින් හෝ ඉලෙක්ට්‍රික් බලයෙන් හෝ ක්‍රියා කරන යන්ත්‍ර පාවිච්චි කරන යම් කර්මාන්තයක්.

(4) කලුක් ගල්, බොරළු, කළුගල් ලබා ගැනීමට වළවල් කැණීම හෝ වළවල් තබා ගැනීම.

(5) මිණිරන් වියලීම හෝ ගබඩා කිරීම.

(6) වළක් කැනීමෙන් හුණු ගල් ලබා ගැනීම.

(7) හාල් හෝ වී මෝලක් තබා ගැනීම.

(8) යන්ත්‍ර සූත්‍ර ආදියෙන් පොල් තෙල් සිඳීම.

(9) සෙක්කුවකින් පොල් තෙල් සිඳීම.

(10) දර හෝ ලී මඩුවක් තබා ගැනීම.

(11) කෙඳි වර්ග තෙලීම හෝ ගබඩා කිරීම.

(12) කපු පුළුන්, නූල් හෝ පිදුරු ගබඩා කිරීම.

(13) භූමිතෙල් ගබඩාවක් තබා ගැනීම.

(14) මුද්‍රණාලයක් තබා ගැනීම.

(15) කපාපු පොල් සකස් කිරීම.

(16) ස්වර්ණාභරණ සෑදීම.

(17) අම්ලකර වායුව පාවිච්චි කරන ගරාජයක් තබා ගැනීම.

(18) කොප්පරා ගබඩා කිරීම.

(19) පොල් කටු අඟුරු ගබඩා කිරීම.

(20) කම්හලක් තබා ගැනීම.

3. පහත දැක්වෙන කර්මාන්ත අප්‍රසන්නවූ හා අන්තරා දායක කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ :—

(1) කෙඳි වර්ග සායම් කිරීම.

(2) ගඩොල් හෝ උළු පිච්චීම.

(3) බැටරි චාජ් කිරීම.

(4) හුණුගල් පිච්චීම, ගබඩා කිරීම, සකස් කිරීම හෝ කැබලි කිරීම.

(5) අඟුරු සඳහා පොල් කටු පිළිස්සීම.

---

ඇල්. ජී. බී.—ජී.සී. 14/31

## ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වෙනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ මුරුතැන්ගේ ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව විසින් සම්පාදිතව, 1947 සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිතවූ එකී වගන්තියේ (3) වෙනි උප වගන්තියෙන් පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍ය කාර්‍යාංශයේ ස්ථාවර ලේකම් තැන.

ඔක්තෝබර් 30 දින කොළඹ දීය.

### අතුරු ව්‍යවස්ථා

#### රථවාහන හා සතුන් පිළිබඳ බද්ද

1. (1) ආඥාපනතේ 47 වෙනි වගන්තිය යටතේ අයකරනු ලබන රථවාහන හා සතුන් පිළිබඳ බද්ද වෙනුවෙන් ඒ බද්දට යටත්වූ යම් රථවාහනයක් හෝ සතෙකු අයිතිව හෝ භාරව හෝ පාලනයෙහි තබා ගෙන හෝ සිටින්නාවූ සෑම අයෙකු විසින්ම සාමාන්‍යයෙන් මෙහි පහත සඳහන් කොට ඇති "ඒ" උප ලේඛනයේ සඳහන් ෆෝර්මයේ ප්‍රකාර විස්තර උප ලේඛනයක්, සභාපති තුමාට සැපයිය යුතුයි. මේ ෆෝර්ම ගම්කාර්‍ය සභා කාර්‍යාලයෙන් ලබාගත හැකිසි.

(2) ආඥාපනතේ 47 වෙනි වගන්තිය යටතේ බද්ද ගෙවීමට බැඳී සිටින අය විසින්, 1959 වර්ෂය වෙනුවෙන් ඒ උප ලේඛනය සම්පූර්ණ කොට 1958 දෙසැම්බර් මස තිස්එක්වෙනි දිනට හෝ ඊට මත්තෙන් සභාපතිතුමා වෙත යැවිය යුතුයි. එකී අය ඒ වාහනය හෝ සතා හෝ අයිතිව හෝ භාරව හෝ පාලනයෙහි තබාගෙන හෝ සිටින්නාවූ ඊට පසු මොනම අවුරුද්දක් වෙනුවෙන්වත් එකී අයගෙන් එබඳු උප ලේඛනයක් අවශ්‍ය නැත.

2. ආඥාපනතේ 47 (2) වෙනි වගන්තියේ විධිවිධාන වලට යටත්ව 1 වෙනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උප ලේඛනය සැපයුවාවූ සෑම අයෙක්ම තව දුරටත් දැනුම් දෙනු ලැබීමක් නැතිව—

(අ) ඒ උප ලේඛනයේ සඳහන් රථවාහන හා සතුන් සඳහාවූ බද්ද 1959 අවුරුද්ද වෙනුවෙන් ඒ අවුරුද්දේ මාර්තු මස තිස් එක් වෙනිදා හෝ ඊට මත්තෙන් හෝ ගෙවීමට යටත් වෙති. තවද,

(ආ) ඊට පසු එක් එක් වර්ෂ වෙනුවෙන් ඒ උප ලේඛනයේ සඳහන් තමාට අයිතිව හෝ තමාගේ භාරයේ හෝ තමාගේ පාලනය පිට හෝ තිබෙන්නාවූ එකී රථවාහන හා සතුන් සඳහාවූ බද්ද, එකී එක් එක් අවුරුද්දේ මාර්තු මස තිස් එක් වෙනිදට හෝ ඊට මත්තෙන් හෝ ගෙවීමට යටත් වෙති.

3. 1 වෙනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උප ලේඛනය සැපයුවාට පසු යම් කිසිවෙකු විසින් ඒ උප ලේඛනයේ සඳහන් නොකරන ලද්දාවූද ආඥාපනත යටතේ බද්දට යටත්වූද යම් රථ වාහනයක් හෝ සතෙකු අත්පත් කරගෙන, තබාගෙන හෝ පාවිච්චියට ගෙන තිබේ නම් හෝ 1 වෙනි අතුරු ව්‍යවස්ථාව යටතේ යම් උප ලේඛනයක් සපයා නැත්තාවූ යම් කිසිවෙකු විසින් එකී බද්දට යටත් යම් රථ වාහනයක් හෝ සතෙකු පළමුවන වරට අත්පත් කරගෙන, තබාගෙන හෝ පාවිච්චියට ගෙන තිබේ නම්, එවිට ඒ අය විසින් එබඳු යම් රථ වාහනයක් හෝ සතෙකු හෝ අත්පත් කරගැනීමේ හෝ තබා ගැනීමට නොහොත් පාවිච්චි කිරීමට හෝ පටන් ගැනීමේ දින සිට එක මාසයක් ඇතුලතදී සාමාන්‍යයෙන් මෙහි පහත සඳහන් කොට ඇති "ඒ" උප ලේඛනයේ සඳහන් පෝර්මයේ ප්‍රකාරයට ලියවිල්කින් වූ දැන්වීමකින් එසේ අත්පත් කරගත් බව සභාපතිතුමාට දැන්විය යුතුයි.

4. ආඥාපනතේ 47 (2) වෙනි වගන්තියේ විධිවිධාන වලට යටත්ව 3 වෙනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින් වූ ලේඛනය සැපයුවාවූ සැම අයෙක්ම, එකී ලේඛන සැපයූ අවුරුද්ද වෙනුවෙන් ද, ඊට පසු සැම අවුරුද්දක් වෙනුවෙන් ද එකී ලේඛනයේ සඳහන් කරණු ලැබූ තමාට අයිතිව හෝ තමාගේ භාරයේ හෝ තමාගේ පාලනයේ හෝ තිබෙන්නාවූ රථවාහන හා සතුන් සඳහාවූ බද්ද, ඒ සඳහා සභාපතිතුමා විසින් තමාට දැනුම්දෙනු ලබන යම් කාල සීමාවක් තුළදී ගෙවීමට බැඳී සිටිති.

5. (1) 1 වෙනි ව්‍යවස්ථාවේ සඳහන් උප ලේඛනය හෝ 3 වෙනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින්වූ ලේඛනය හෝ සැපයුවාට පසු ඒ උප ලේඛනයට ඇතුලත් කළාවූ හෝ ලේඛනයේ සඳහන් කළාවූ හෝ යම් රථවාහනයක් හෝ සතෙකු සම්බන්ධයෙන්වූ බද්ද ද ගෙවීමට බැඳීමෙන් ආඥාපනතේ 47 (3) වෙනි වගන්තිය යටතේ තමා නිදහස් කිරීමට අයිතිවාසිකම් කියා සිටින සැම අයෙකු විසින්ම එසේ නිදහස් කිරීමට අයිතිවාසිකම් කියා සිටින්නේ අසවල් අසවල් හේතු නිසායයි දැක්වෙන ලියකියවිල්ලකින්වූ දැන්වීමක් වහාම සභාපතිතුමා වෙත යැවිය යුතුයි.

(2) 1 වෙනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උප ලේඛනය හෝ 3 වෙනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියකියවිල්ලකින්වූ ලේඛනය හෝ සැපයුවාට පසු ඒ රථවාහන හෝ සතා තබා ගැනීම හෝ පාවිච්චි කිරීම නතර කළාවූ නොහොත් ඒ පිළිබඳ අයිතිවාසිකම් අත්හැරියාවූ සැම අයෙකු විසින්ම ලියකියවිල්ලකින්වූ දැන්වීමක්, තමා ඒ සතා හෝ රථවාහනය තබා ගැනීම හෝ පාවිච්චි කිරීම හෝ නතරකළ බව නොහොත් ඒ ගැන අයිතිවාසිකම අත්හල බව වහාම සභාපතිතුමා වෙත ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

6. යම් කිසිවෙකු විසින් බද්ද ගෙවූවිට සභාපතිතුමා විසින් ඒ බද්ද ගෙවූ වාහනය වෙනුවෙන් ඒ අයට මෙහි පහත සඳහන් කොට ඇති "බී" උප ලේඛනයේ ප්‍රකාරයට ඒ ඒ රථවාහන සඳහා වෙන් වෙන් වශයෙන් යොදා ඇති විශේෂ අකුරුද, තහඩුව නිකුත් කරන අවුරුද්ද දැක්වෙන ඉලක්කම්ද, රථවාහන රෙජිස්ටරයේ ඒ ඒ රථවාහන පිළිබඳ වූ අංකයද සටහන් කොට ඇති තහඩුවක් නිකුත් කළ යුතුය. එබඳු යම් තහඩුවක් පාවිච්චිය නිසා හෝ වෙන යම් ලෙසකින් හෝ නොපැහැදිලිව නොහොත් මැකී ගෙස් තිබෙතහොත් ඒ තහඩුව අයිතිකාරයා විසින් සභාපතිතුමාට ආපසු භාරදිය යුතුයි. තවද ඔහු විසින් ශත පණහක් ගෙවූ විට ඔහුට අළුත් තහඩුවක් ලබාගැනීමට අයිතිවාසිකම් තිබේ.

7. සැම රථවාහනයකම අයිතිකරු විසින් හෝ භාරකරු විසින්, 6 වෙනි අතුරු ව්‍යවස්ථාව යටතේ ඒ රථවාහනය වෙනුවෙන් නිකුත් කරනලද තහඩුව, ඒ රථවාහනයේ කාටත් පෙණෙන තැනක සවිකළ යුතුයි.

8. සභාපතිතුමා විසින් හෝ එතුමාගේ ලියවිල්ලකින් බලය ලත් ඕනෑම නිලධාරියකු විසින් හෝ ඕනෑම මාවතක හෝ පාරක ගමනාගමනයෙහි යෙදී තිබෙන රථවාහනයක්, ඒ රථවාහනයෙහි 7 වෙනි අතුරු ව්‍යවස්ථාවෙහි ප්‍රකාර සවිකොට තිබිය යුතු තහඩුව පරීක්ෂා කර බැලීම පිණිස නවත්වා නතර කිරීම නීත්‍යානුකූල වන්නේය. තවද සභාපතිතුමා විසින් හෝ නිලධාරියා විසින් ඉල්ලීමක් කර සිටිය කල්හි එකී ඕනෑම රථයක් භාරකාරයා විසින් හෝ ඒ රථය පදවන්නා විසින් හෝ ඒ රථය නවත්වා සභාපතිතුමාට හෝ එකී නිලධාරියාට හෝ එකී තහඩුව පරීක්ෂාකර බැලීමට ඉඩ දිය යුතුයි.

9. මේ අතුරු ව්‍යවස්ථාවල—

"සභාපතිතුමා" යනුවෙන් කාර්ය සභාවේ සභාපතිතුමා අදහස් කරනු ලැබේ ;

"කාර්ය සභාව" යනුවෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ මුරුතැන්ගෙ ගම් ප්‍රදේශයේ ගම්කාර්ය සභාව අදහස් කරනු ලැබේ ;

"ආඥාපනත" යනුවෙන් ගම්සභා ආඥාපනත (198 වෙනි පරිච්ඡේදය) අදහස් කරනු ලැබේ.

10. කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඇතැම් ගම්කාර්ය සභා විසින් සම්පාදනය කරනු ලැබ 1940 අගෝස්තු මස 23 වෙනි දින අංක 8,655 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද්දාවූ රථවාහන හා සතුන් පිළිබඳ බද්ද සම්බන්ධවූ අතුරු ව්‍යවස්ථා, කුරුණෑගල දිස්ත්‍රික්කයේ මුරුතැන්ගේ ගම් ප්‍රදේශයේ ගම්කාර්ය සභාවට පමණක් අදාලවන පරිද්දෙන් අවලංගු කොට ඒවා මෙයින් සංශෝධනය කරනු ලැබේ.

## "ඒ" උප ලේඛනය

### පෝර්මය

#### මුරුතැන්ගෙ ගම්ප්‍රදේශයේ ගම්කාර්ය සභාව

රථවාහන හා සතුන් පිළිබඳ බද්ද සම්බන්ධයෙන්වූ අතුරු ව්‍යවස්ථාවල ප්‍රකාර සැපයියයුතු රථවාහන හා/හෝ සතුන් පිළිබඳ ලේඛණයයි.

අයිතිකරුගේ නම :————————.

ගම :————————.

තැපැල් :————————.

ඡන්ද කොඨාශයේ නම-හෝ අංකය :————————.

ගම්මුලාදෑනි කොඨාශය :————————.

| රථවාහන හා/හෝ සතුන් පිළිබඳ විස්තර | ගණන වචන වලින් | වෙනත් විස්තර |
|---|---|---|
| කරත්ත, තිරික්කල හෝ ජින් රික්ෂෝ කරත්ත හැර ඕනෑම අන්දමක වාහන ... | | |
| ඕනෑම අන්දමක ගොන් දෙන්නා බඳින බර කරත්ත හෝ තිරික්කල ... ... | | |
| තනිගොනා බඳින බර කරත්ත හෝ තිරික්කල | | |
| අත් කරත්ත ... ... | | |
| ජින් රික්ෂෝ කරත්ත ... ... | | |
| බයිසිකල් (වෙනත් විස්තර සඳහා සපයා ඇති තීරයේ සාදන ලද අයගේ නොම්මරය සඳහන් කරනු) | | |
| අලි ... ... ... | | |
| අශ්වයෝ ... ... | | |
| අශ්වතරයෝ ... ... | | |
| බූරුවෝ ... ... ... | | |

ඉහත සඳහන් විස්තර සත්‍ය බවත් නිවැරදි බවත් මම මෙයින් ප්‍රකාශ කරමි.

දිනය :————————.

අයිතිකරුගේ අත්සන :————————.

## "බී" උප ලේඛනය

| | |
|---|---|
| කරත්ත, තිරික්කල හෝ ජින් රික්ෂෝ කරත්ත හැර ඕනෑම අන්දමක වාහන ... | මු.ග.ස.ර. |
| ඕනෑම අන්දමක සැම ගොන් දෙන්නා බඳින කරත්ත හෝ තිරික්කලයක් සඳහා ... | මු.ග.ස.බ.ක. |
| සැම තනිගොනා බඳින කරත්තයක් හෝ අත් කරත්තයක් සඳහා ... ... | මු.ග.ස.බා.ක. |
| සැම බයිසිකලයක් සඳහා ... ... | මු.ග.ස.බ. |
| සැම අත් කරත්තයක් සඳහා ... ... | මු.ග.ස.අ.ක. |
| සැම ජින් රික්ෂෝ කරත්තයක් සඳහා ... | මු.ග.ස.ජී.ක. |

එල්.ජී.ඩී.—ජීඩී14/53.

## ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ උතුරු නුවරගම් කෝරළයේ ගම් ප්‍රදේශයේ ගම්කාර්ය සභාව විසින් සම්පාදිතව, 1947 සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිතවූ එකී වගන්තියෙන් පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍ය තුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1958 සැප්තැම්බර් 30 වැනි දින,
කොළඹ.

### රථවාහන සහ සතුන් පිළිබඳ බද්ද

1. (1) ආඥාපනතේ 47 වැනි වගන්තිය යටතේ අය කරනු ලබන රථ වාහන හා සතුන් පිළිබඳ බද්ද වෙනුවෙන් ඒ බද්දට යටත්වූ යම් රථවාහනයක් හෝ සතකු අයිතිව හෝ භාරව හෝ පාලනයෙහි තබාගෙන හෝ සිටින්නාවූ සැම අයෙකු විසින්ම සාමාන්‍යයෙන් මෙහි පහත සඳහන් ඒ උප ලේඛනයෙහි දැක්වෙන පෝර්මයේ ප්‍රකාර විස්තර උප ලේඛනයක් ප්‍රධාන තුමාට සැපයිය යුතුයි. මේ පෝර්ම ගම්කාර්ය සභා කාර්යාලයෙන් ලබාගත හැකිය.

(2) ආඥාපනතේ 47 වැනි වගන්තිය යටතේ බද්ද ගෙවීමට බැඳී සිටින අය විසින් 1959 වැනි වර්ෂය වෙනුවෙන් 'ඒ' උප ලේඛනය සම්පූර්ණ කොට 1959 පෙබරවාරි 15 වැනි දින හෝ ඊට මත්තෙන් ප්‍රධාන තුමා වෙත යැවිය යුතුයි. එකී අය ඒ වාහනය හෝ සතා හෝ අයිතිව හෝ භාරව හෝ පාලනයෙහි තබාගෙන සිටින්නාවූ ඊට පසු මොනම අවුරුද්දක් වෙනුවෙන් වත් එකී අයගෙන් එබඳු උප ලේඛනයක් අවශ්‍ය නැත.

2. ආඥාපනතේ 47 (2) වැනි වගන්තියේ විධි විධාන වලට යටත්ව 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උප ලේඛනය සැපයූමාවූ සෑම අයෙක්ම තව දුරටත් දැනුම්දෙනු ලැබීමක් නැතිව—

(අ) උප ලේඛනයේ සඳහන් රථ වාහන හා සතුන් සඳහාවූ බද්ද 1959 අවුරුද්ද වෙනුවෙන් ඒ අවුරුද්දේ මාර්තු මස තිස් එක් වෙනිදා හෝ ඊට මත්තෙන් හෝ ගෙවීමට යටත් වෙති. තවද

(ආ) ඊට පසු එක් එක් වර්ෂය වෙනුවෙන් ඒ උප ලේඛනයේ සඳහන් කරන ලදුව එකී වර්ෂයේ දවස් තිහකට වැඩි කාලයක් තමාට අයිතිව හෝ තමාගේ භාරයේ පාලනය පිට හෝ තිබෙන්නාවූ එකී රථ වාහන හා සතුන් සඳහාවූ බද්ද එකී එක් එක් අවුරුද්දේ මාර්තු මස තිස් එක්වෙනිදා හෝ ඊට මත්තෙන් ගෙවීමට යටත් වෙති.

3. 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උප ලේඛනය සැපයූවාට පසු යම්කිසිවකු විසින් ඒ උප ලේඛනයෙහි සඳහන් කරන ලද්දවූද, ආඥාපනත යටතේ බද්දට යටත්වූද, යම් රථ වාහනයක් හෝ සතකු අත්පත් කරගෙන, තබාගෙන හෝ පාවිච්චියට ගෙන තිබේ නම්, එක්කෝ ඉහතින් සඳහන් 1 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ යම් උප ලේඛනයක් සපයා නැත්තාවූ යම් කිසිවෙකු විසින් එකී බද්දට යටත් යම් රථ වාහනයක් හෝ සතකු පළමුවෙන් අත්පත් කරගෙන තබාගෙන හෝ පාවිච්චියට ගෙන තිබේ නම් එවිට ඒ අය විසින් එබඳු යම් රථ වාහනයක් හෝ සතකු අත්පත්කර ගැනීමේ හෝ තබා ගැනීමට නොහොත් පාවිච්චි කිරීමට පටන් ගැනීමේ දින සිට එක මාසයක් ඇතුළතදී සාමාන්‍යයෙන් මීට යා කොට ඇති "ඒ" උප ලේඛනයේ සඳහන් ෆෝර්මයේ ප්‍රකාරයට ලියවිල්ලකින්වූ දැන්වීමකින්, එසේ අත්පත් කර ගත් බව ප්‍රධාන තුමාට දැනුම් දිය යුතුයි.

4. ආඥාපනතේ 47 (2) වැනි වගන්තියේ විධි විධාන වලට යටත්ව 3 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින්වූ ලේඛනය සැපයුවාවූ සෑම අයෙක්ම එකී ලේඛනය සැපයූ අවුරුද්ද වෙනුවෙන්ද ඊට පසු සෑම අවුරුද්දක් වෙනුවෙන්ද එකී ලේඛනයෙහි සඳහන් කරනු ලැබ තමාට අයිතිව හෝ තමාගේ භාරයේ හෝ තමාගේ පාලනය පිට හෝ තිබෙන්නාවූ රථ වාහන හා සතුන් සඳහාවූ බද්ද ඒ සඳහා ප්‍රධාන තුමා විසින් තමාට දැනුම්දෙනු ලබන යම් කාල සීමාවක් ඇතුළතදී ගෙවීමට බැඳී සිටිති.

5. 1 (1) වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උප ලේඛනය හෝ 3 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින්වූ ලේඛනය හෝ සැපයුවාට පසු ඒ උප ලේඛනයට ඇතුළත් කළාවූ හෝ ලේඛනයෙහි සඳහන් කළාවූ හෝ යම් රථ වාහනයක් හෝ සතකු සම්බන්ධයෙන්වූ බද්ද ගෙවීමට බැඳීමෙන් ආඥාපනතේ 47 (3) වැනි වගන්තිය යටතේ තමා නිදහස් කිරීමට අයිතිවාසිකම් කියා සිටින්නේ අසවල් අසවල් හේතූන් නිසා යයි දක්වෙන ලියවිල්ලකින්වූ දැන්වීමක් වහාම ප්‍රධාන තුමා වෙත යැවිය යුතුයි.

(2) 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උප ලේඛනය හෝ 3 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින්වූ ලේඛනය හෝ සැපයුවාට පසු ඒ රථ වාහනය හෝ සතුන් තබා ගැනීම හෝ පාවිච්චි කිරීම නතර කළාවූ නොහොත් ඒ පිළිබඳ අයිතිවාසිකම් අත්හැරියාවූ සෑම අයෙකු විසින්ම ලියවිල්ලකින්වූ දැන්වීමකින් තමා ඒ සතා හෝ රථ වාහනය තබා ගැනීම හෝ පාවිච්චි කිරීම නතර කළ බව නොහොත් ඒ ගැන අයිතිවාසිකම් අත්හළ බව වහාම ප්‍රධාන තුමා වෙත ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

6. යම් කිසිවෙකු විසින් බද්ද ගෙවූ විට ප්‍රධාන තුමා විසින් ඒ බද්ද ගෙවූ රථ වාහන වෙනුවෙන් ඒ අයට මෙහි පහත සඳහන් උප ලේඛනයෙහි "බී" ෆෝර්මයේ ප්‍රකාරයට ඒ ඒ රථ වාහන සඳහා වෙන් වෙන් වශයෙන් යොදා ඇති විශේෂ අකුරු තහඩුද නිකුත් කරන අවුරුද්ද දක්වෙන ඉලක්කම්ද රථ වාහන රෙජිස්ටරයේ ඒ. ඒ රථ වාහනය පිළිබඳවූ අංකයද සටහන් කොට ඇති තහඩුවක් නිකුත් කළ යුතුයි. එබඳු යම් තහඩුවක් පාවිච්චිය නිසා හෝ වෙනයම් ලෙසකින් හෝ නොපැහැදිලිව නොහොත් මැකී ගොස් තිබෙතොත් ඒ තහඩුව අයිතිකාරයා විසින් එය ප්‍රධාන තුමාට ආපසු භාර දිය යුතුයි. තවද ඔහු විසින් ශත පණහක් ගෙවූ විට ඔහුට අළුත් තහඩුවක් ලබා ගැනීමට අයිතිවාසිකම තිබේ. එබඳු යම් තහඩුවක් නැතිවී හෝ සොරාගෙන තිබෙන බැව් දිවුරුම් සහතිකයකින් හෝ වෙනයම් ලෙසකින් ප්‍රධාන තුමාට ඒත්තු ගැනීමට සැලැස්සුව හොත් එතුමා විසින් අයිතිකාරයාගේ ඉල්ලීම පිටත් ඔහු විසින් ශත හැටක් ගෙවනු ලැබූ විටත් අළුත් තහඩුවක් නිකුත් කළ හැකිය.

7. සෑම රථ වාහන අයිතිකරු විසින් හෝ භාරකරු විසින්ම 6 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ඒ රථ වාහනය වෙනුවෙන් නිකුත් කරන ලද තහඩුව ඒ රථ වාහනයේ කාටත් පෙනෙන තැනක සවිකළ යුතුයි.

8. ප්‍රධාන තුමා හෝ එතුමාගේ ලියවිල්ලකින් බලය ලත් ඕනෑම නිලධාරියෙකු විසින් හෝ ඕනෑම පොලිස් නිලධාරියෙකු විසින් හෝ ඕනෑම මාවතක හෝ පාරක ගමනාගමනයෙහි යෙදී තිබෙන රථ වාහනයක්, ඒ රථ වාහනයෙහි, 7 වැනි අතුරු ව්‍යවස්ථාවේ ප්‍රකාර සවිකොට තිබිය යුතු තහඩුව පරීක්ෂාකර බැලීම පිණිස නවත්වා නතර කිරීම නීත්‍යානුකූල වන්නේය. තවද ප්‍රධාන තුමා විසින් හෝ එකී නිලධාරියා විසින් ඉල්ලීමක් කර සිටි කල්හි එකී ඕනෑම වාහනයක භාරකාරයා විසින් හෝ ඒ රථය පදවන්නා විසින් ඒ රථය නවත්වා ප්‍රධාන තුමාට හෝ එකී නිලධාරියාට හෝ එකී තහඩුව පරීක්ෂා කර බැලීමට ඉඩදිය යුතුයි.

9. ගම්කාරක සභාව විසින් සම්පාදනය කරනු ලැබ 1941 ඔක්තෝබර් මස 3 වැනි දින අංක 8,798 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද රථ වාහන හා සතුන් පිළිබඳ බද්ද සම්බන්ධයෙන්වූ අතුරු ව්‍යවස්ථා මෙයින් අවලංගුකර දැමීමට යෙදුනා ඇත.

10. මේ අතුරු ව්‍යවස්ථාවල :—

"ප්‍රධාන තුමා" යනුවෙන් කාරක සභාවේ ප්‍රධාන තුමා අදහස් කරනු ලැබේ;

"කාරක සභාව" යනුවෙන් අනුරාධපුර දිස්ත්‍රික්කයේ උතුරු නුවර ගම්කෝරළයේ ගම් ප්‍රදේශයේ ගම්කාරක සභාව අදහස් කරනු ලැබේ;

"ආඥාපනත" යනුවෙන් ගම්සභා ආඥාපනත (198 වැනි පරිච්ඡේදය) අදහස් කරනු ලැබේ.

## "ඒ" උප ලේඛනය

### ෆෝර්මය

**උතුරු නුවරගම්කෝරළයේ ගම්ප්‍රදේශයේ ගම්කාරක සභාව**

රථවාහන හා සතුන් පිළිබඳ බද්ද සම්බන්ධයෙන් වූ අතුරු ව්‍යවස්ථාවල ප්‍රකාරයට සැපයිය යුතු රථ වාහන හා/*හෝ සතුන් පිළිබඳ ලේඛනයයි.

අයිතිකාරයාගේ නම :————.

ජන්දදායක කොට්ඨාශයේ අංකය :————.

ගම :————.

| රථවාහන හා*/හෝ සතුන් පිළිබඳ විස්තරය | ගණන වචනවලින් | වෙනත් විස්තර |
|---|---|---|
| කරත්ත, තිරික්කල හෝ ජින් රික්ෂෝ රථ හැර ඕනෑම අන්දමක වාහන... | | |
| ඕනෑම අන්දමක ගොන් දෙන්නා බඳින බර කරත්ත හෝ තිරික්කල | | |
| තනිගොනා බඳින බරබාග කරත්ත හෝ තිරික්කල ... | | |
| අත් කරත්ත ... ... | | |
| ජින් රික්ෂෝ රථ ... ... | | |
| බයිසිකල් (වෙනත් විස්තර සඳහා සැපයුන කොටසේ සාදන ලද අයගේ නොම්මරය සඳහන් කරනු) | | |
| අලි ... ... | | |
| අශ්වයෝ ... ... | | |
| අශ්වතරයෝ ... ... | | |
| බූරුවෝ ... ... | | |

ඉහත සඳහන් විස්තරය සත්‍ය බවත් නිවරදි බවත් මෙයින් ප්‍රකාශ කර සිටිමි.

අයිතිකාරයාගේ අත්සන :————.

දිනය :————.

* නුවමනා වචන කපා හරිනු.

## "බී" උප ලේඛනය

කරත්තයක් තිරික්කලයක් හෝ ජින් රික්ෂෝ රථයක් හැර වෙනත් ඕනෑම අන්දමක වාහනයක් සඳහා ... ... උ. නු. වා.

සෑම ගොන් දෙන්නා බඳින ලද බර කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... ... උ.නු.බ.ක.

සෑම තනි ගොනා බඳින බර බාග කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... ... උ.නු.බා.ක.

සෑම බයිසිකලයක් සඳහා ... ... උ. නු. බ.

සෑම අත්කරත්තයක් සඳහා ... ... උ.නු.අ.ක.

සෑම ජින් රික්ෂෝ රථයක් සඳහා ... ... උ. නු. ජි.

# දේපල විකිණීම

## දෙව්නුවර නගර සභාව

**1947 සිට 1955 අවසානය දක්වා හිඟව තිබෙන වරිපනම් බදු නොගෙවූ හෙයින් දේපල විකිණීම**

1947 පළමුවෙනි කාර්තුවේ සිට 1955 හතරවෙනි කාර්තුව අවසානය දක්වා ඇති කාර්තුවලට, මීට ඇඳා තිබෙන උපලේඛනයේ සඳහන් කර ඇති දේපල වෙනුවෙන් ගෙවිය යුතුවූ වරිපනම් බදු නොගෙවා හිඟව තිබීම කරණකොටගෙන, අල්වා තගනාමට ගතයුතු චංචල දේපල නොමැති නිසා 1946යේ වර්‍ෂයේ අංක 3 දරණ සුළුනගර සභා ආඥපනතේ 179 සහ 183 (1) දරණ ඡේදයන්ගෙන් කියවෙන පරිදි 1947තේ අංක 29 දරණ නාගරික සභා ආඥපනතේ 252 වැනි සහ 256 වැනි ඡේද යටතේ මවිසින් නිකුත්කරන ලද වරෙන්තු පත්‍රයක බලය පිට අල්වා ගන්නා ලද, (1) බදුකුලී සහ ලාබද, (2) ලී දඬු සහ උපදින ඵද්ද, (3) ගෙවල් සෑදී තිබෙන ද්‍රව්‍යයද සහ (4) පහත සඳහන්කර තිබෙන දේපලමද, අතරතුර කාලයේදී නියමිත ගාස්තු සහ බදු මුදල් නොගෙවනු ලැබුවහොත්, එහි සඳහන් දිනයන්හිදී පෙරවරු 9.30 පටන්, එම ස්ථානවලදීම ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබනබව මෙසින් නිවේදනය කරනු ලැබේ.

පහත සඳහන් දේපොල සම්බන්ධයෙන් යම් අයබදු ගෙවන්නකු විසින් ගෙවන ලද මුදලක් නැවතත් ඉල්ලනවාය කියා සිතේනම් හෝ ගෙවීමට තිබෙන මුදලේ යම් අවිශ්වාසයක් තිබේනම් හෝ එය ඔප්පු කිරීමට තමා විසින් ගන්නා ලද කුවිතාන්සි මෙම කායාලයේ දී මා ඉදිරිපිටට ගෙනැවිත් පෙන්වීමෙන් පසු එකී මුදලින් නිදහස් කරනු ලැබේ.

තවද, මේ දේපොල විකිණීමට නියමකොට ඇති දිනට අඩු ගණනේ දින දෙකකටත් කලින් එම කුවිතාන්සි ඉදිරිපත්කිරීම කළ යුතු බව විශේෂයෙන් දන්වමි. ඉන්පසු ඉදිරිපත් කරන කුවිතාන්සි ගැන හා එසේ කුවිතාන්සි ඉදිරිපත් කිරීම අතපසු කරන දේපොල සම්බන්ධයෙන් වග නොකියන බවද දන්වමි.

ඇම්. ඇල්. ඇම්. පෙරේරා,
දෙව්නුවර නගර සභා පාලන විශේෂ
කොමසාරිස්තැන.

නාගර සභා කායාලය,
දෙව්නුවර, 11.10.1958.

## උප ලේඛනය

**පරණ නොම්මර වරහන් කොට ඇත.**

කොට්ඨාශ නො. 1—1958 නොවැම්බර් මස 19වෙනි බදාද

ගල්ගනේ පාර : 39 (19); 49/9 (27/8) ;

ලේන් නො. 1 : 39 (13) ; 30 (10) ; 44 (14) ;

මාතර පාර : 56/6 (87/6) ; 96/1 (67/1) ; 108 (55) ; 134/4 (37/4) ; 134/7 (37/7) ; 134/8 (37/8) ; 154 (29) ; 176 (25) ; 190/1 (19/1).

1958 නොවැම්බර් මස 20 වෙනි බ්‍රහස්පතින්දා

නංගල්ල පාර : 37/2 (141) ; 89 (165) ; 89/1 (165/1) ; (89/2 165/2) ; 93 (171) ; 95 (169) ;

වික්‍රමරත්න පාර : 35/10 (14/4) ; 47 (27) ; 6/2 (2/2) ; 18 (10) ; 54 (34).

දෙව්නුවර උතුර-නංගල්ල පාර : 86/1 (71/c).

කොට්ඨාශ නො. 2—1958 නොවැම්බර් මස 21 වෙනි සිකුරාදා

හුනුගොඩ පාර : 15 (2) ; 25 (13/5) ; 31 (19) ; 18 (12) ; 18/1 (12/1) ; 20 (14) ;

කිරළවැල්ල පාර : 31/3 (27/1 ; 27/2); 41 (31) ; 43 (33) ; 57/1 (නැත); 57/9 (47/2C) ; 69/3 (51/2A) ; 69/4 (51/2B) ; 81/6 (63/4) ;

ප්‍රදීපාගාර පාර : 33/1 (නැත) ; 33 (29/1) ;

නංගල්ල පාර ; 6 (132) ; 102 (188) ; 112 (196).

1958 නොවැම්බර් මස 24 වෙනි සඳුදා

විජේතුංග පාර : 4/10 (16/9); 4/17 (20/6); 4/20 (4/15); 4/34 (4/10); 4/37 (2/18) ; 4/42 (නැත) ; 4/46 (2/11A) ; 4/53 (2/8) ; 4/60 (2/3A 4/62 (2/4A) ; 4/63 (2/4B) ; 42 (22/1) ; 68/5 (34/2) ; 21 (නැත).

කොට්ඨාශ නො. 3—1958 නොවැම්බර් මස 26 වෙනි බදාදා

ගලේදන්ඩ පාර : 3 (3) ; 37/3 (නැත) ; 37/4 (නැත) ; 37/10 (7/3) ; 37/11 (7/4);

හුම්මාන පාර : 23/1 (13/2) ; 37/4 (නැත) ; 54 (38) ; 66/1 (46/1) ;

කිරළවැල්ල පාර: 32/3 (26/3) ; 32/11 (26/5); 36/3 (34/3); 40 (36); 42 (40) ; 42/1) ; 40/1 ; (44/1) ; 44/1 44/2 (44/2).

1958 නොවැම්බර් මස 27 වෙනි බ්‍රහස්පතින්දා

කිරළවැල්ල පාර : 52/1 (48/1) ; 52/6 (58/8); 52/11 (58/13); 52/14 (48/2); 52/15 (46/2); 52/17 (46/1); 72/1 (64/1); 72/9 (58/2); 76 (68); 78 (70) ; 80 (72) ; 82 (74) ; 84 (76) ; 86 (78).

කොට්ඨාශ නො. 4—1958 නොවැම්බර් මස 28 වෙනි සිකුරාදා

අම්පිටිය පාර : 7 (5) ; 15 (11) ; 17 (නැත) ; 17/1 (11/1) ; 27/4 (21/1); 27/5 (19/1); 27/6 (19/5) ; 27/10 (31/1) ; 27/14 (19/6); 39 (29) ;

හුම්මාන පාර : 14 (10/1) ;

හුම්මාන ලේන් ; 3 (3) ; 19 (9) ; 23 (9A) ; 43 (19) ; 43/3 (191A) ; 43/4 (19/3) ; 10 (6); 26 (14) ; 32/1 (16/1) ;

කඩිසවැල්ල පාර ; 48 (20) ; 50 (22) ; 68 (32) ; 133 (83 ; 83/1).

1958 දෙසැම්බර් මස 1 වෙනි සඳුදා

ප්‍රදීපාගාර පාර : 163 (107); 173 (111) ; 187/1 (117/1) ; 187/7 (123/2); 187/8A (123/8); 231 (141); 231/12 (141/5) ; 241 (145) ; 241/1 (145/1); 241/4 (143/2) ; 226 (122) ; 226/1 (122/1) ; 226/7 (නැත) ; 226/10 (122/3) ; 232 (128) ; 236/3 (132/2) ; 236/4 (132/1) ;.

මඩන්වැල්ල පාර : 3/1 (1/1); 5 (3); 11/4 (7/2); 10/6 (8/1) ; 14 (10) ; 16 (12) ; 16/1 (12/1) ; 20/3 (12/3) ;.

සැන්ඩිස් පාර : 7 (3) ; 23 (11) ; 16 (8) ;

සිංහාසන පාර ; 227/1 (121/2) ; 231 (125) ; 241 (131).

කොට්ඨාශ නො. 5—1958 දෙසැම්බර් මස 2 වෙනි අඟහරුවාදා

අම්පිටිය පාර ! 40 (14) ; 40/4 (14/1);

ප්‍රදීපාගාර පාර ; 22 (12) ; 38 (26) ; 96 (58) ; 188/1 (94/1) ; 192 (96); 194 (98) ;

පියරතන පාර (රිඩී පෙදෙස) ; 12 (4) ;

සිංහාසන පාර : 63/6 (27) ; 85/3 (43/2) ; 91 (45) ; 95 (49/1) ; 121 (61) ; 123 (63); 125 (65); (149/2) ; (79/2) 149/6 (83/2) ; 183 (95/2) ; 193/4 (105/3).

කොට්ඨාශ නො. 6—1958 දෙසැම්බර් මස 3වෙනි බදාදා

කිරිසාරුව පාර (හන්ටර් පාර) : 47/1 (13/1) ; 47/2 (13/2) ;

ගම්මඩුව පාර (ලැන්වරි පාර) : 27/1 (5) ; 75 (17); 70/1 (28/1) ; 82/1 (32/5) ; 88 (32/1) ; 106/1 (නැත) ;

මාතර පාර ; 73 (70/6) ; 75 (70/4) ; 85 (68) ; 89 (66) ; 105/5 (52/2); 137/3 (නැත) ; 143 (36); 155/2 (32/2) ; 155/3 (32/4) ; 165/4; (28/1) ; 197 (20) ; 267 (නැත);

සිංහාසන පාර ; 12/2 (8/2) ; 52/1 (42/3) ; 52/2 (42/2) .

1958 දෙසැම්බර් මස 4 බ්‍රහස්පතින්දා

මගුල්වැල්ල පාර (ස්ට්‍රෝන් පාර) : 17 (3) ; 37 (19) ; 45/1 (25/3) ; 63/1 (35/1); 67 (37); 28/5 (12/3); 28/7 (52/3 නංගල්ල පාර) ; 28/8 ; (52/4) ; 28/15 (6/4) ; 28/16 (6/3) ; 34 (14) ; 46 (20) ; 52 (නැත) ;

දෙව්නුවර බටහිර-නංගල්ල පාර : 243 (10) ;

දෙව්නුවර බටහිර—මහුල්වැල්ල පාර (ස්ට්‍රෝන් පාර) ; 28/3 (12/1).

කොට්ඨාශ නො. 7—1958 දෙසැම්බර් මස 5 වෙනි සිකුරාදා

පනන්සිල්ල පාර : 11/2 (5/1); 11/6 (7/2) ; 29 (නැත) ; 33 (21) ; 45 (35) ; 45/4 (37/2); 49 (37) ; 53 (41) ; 12 (4) ; 12/1 (25) ; 24 (12) ; 24/1 (6/6) ; 24/3 (12/1); 40/1 (18/3); 46 (20); 48 (24/1) ; 52/1 (නැත); 52/4 (26/1) ; 52/8 (24/7) ; 52/10 (24/4) ; 58 (32) ; 70/7 (36/1).

1958 දෙසැම්බර් මස 8 වෙනි සඳුදා

සිංහාසන පාර : 70/4 (50/2) ; 110 (82) ; 116 (88) ; 116/4) (85/5); 116/5 (84/3) ; 120 (94) ; 122 (96) ; 124 (98).

වාඩියා පාර : 15 (9) ; 23 (17) ; 29/1 (නැත) ; 35 (31) ; 43 (37) ; 55 (47) ; 20 (12); 24/2 (14/3) ; 30 (20) ; 30/1 (20/1) ; 32 (22) ; 36 (26) ; 42 (32) ; 42/3 (32/4);

වෙලේගොඩ පාර ; 43 (27).

# විවිධ දැන්වීම්

## දෙහිගම්පල් කෝරළේ සහ පහත බුලත්ගම ගම්කායසභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත

මෙහි පහත දක්වෙන උපලේඛනයෙහි සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා විකිණීම පිණිස 1959 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධව දෙහිගම්පල් කෝරළේ සහ පහත බුලත්ගම ගම්කායසභා ප්‍රදේශය ඇතුළත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධවන්නේ අසවල් කරුණු සඳහායයි දක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සිටින සේ මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට 14 දිනක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ 201 වැනි පරිච්ඡේදයේ අංක 7 දරණ 1947 අංක 44 දරණ ආඥපනතින් සංශෝධිතවූ අංක 6 දරණ ආඥපනත යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩී. ඇම්. ද සිල්වා,
දෙහිගම්පල් කෝරළේ සහ පහත බුලත්ගම
ගම්කායසභාවේ ප්‍රධානතැන.

ගම්කායසභා කායාලය,
රුවන්වැල්ල. 1958.10.2 වැනි දින දීය.

### උප ලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| (1) ඇස්. ඇල්. ඇම්. සෙයිනුදීන්, අඟුරුවැල්ල, රුවන්වැල්ල | රුවන්වැල්ල. සීමා තොට නොහොත් රන්තනකොටුව. අංක 68/42. | හරක්මස් සහ එලුමස් |
| (2) ඇස්. ඇල්. ඇම්. සෙයිනුදීන්, අඟුරුවැල්ල, රුවන්වැල්ල | අඟුරුවැල්ල, අඟුරු වැල්ලේවත්ත, අංක 34/40 | හරක්මස් සහ එළුමස් |
| (3) ඇස්. ඇල්. ඇම්. සෙයිනුදීන්, අඟුරුවැල්ල, රුවන්වැල්ල | කන්නත්තොට ගල් පොත්තේ පැල වත්ත | හරක්මස් සහ එළුමස් |
| (4) කේ. ඇම්. අබ්දුල් කාදර්, | බුලත්කොහුපිටිය. ගිනිවලපිටිය, අංක 41 | හරක්මස් |
| (5) ඊ. ඇම්. යූසුප්, යූ. සී. මාර්කට්, අවිස්සාවේල්ල | සියඹලාගහතොට මාර්කට් වත්ත, අංක 71, රුවන් වැල්ල | හරක්මස් සහ එළුමස් |
| (6) ඉසෙඩ්. ඇම්. ඇම්. ෂෙරිප්, විලේගොඩ, ඇහැලියගොඩ | අංක 1 කඩ කාමරය, යටියන්තොට මාර්කට්, | හරක්මස් |
| (7) සී. ඇල්. ඒ. මන්සූර්, යටියන්තොට | අංක 2 කඩ කාමරය, මාර්කට්, යටියන් තොට | හරක්මස් |
| (8) ඇස්. ඇම්. හසන්, ගොමාඩුව, යටියන්තොට | අංක 1 කඩ කාමරය, යටියන්තොට | එළුමස් |
| (9) පී. ඒ. වාප්පු, කොළඹ පාර, යටියන්තොට | අංක 2 කඩ කාමරය, යටියන්තොට | එළුමස් |

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.